# විකල්ප සංවර්ධන මාවත් හා තුලිත ආර්ථිකය

අජිත් දිසානායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ නිදහස ලැබීමට පෙර දක්නට ලැබුණ ආර්ථික ක්‍රියාවලිය දෙස සුපරීක්ෂාකාරීව බලන්නේ නම් එහි තිබී ඇත්තේ සංවෘත නොවූ ආර්ථිකයකි. මීලඟට සලකා බැලිය යුතු වන්නේ නිදහසින් පසු ආර්ථිකයේ ගමන් මාර්ගය කෙසේද යන්නයි. නිදහස ලැබුණ මුල් වසර කීපය තුළ දේශීය ආදායම දේශීය වියදමට වඩා යහපත් අගයක් ගෙන තිබූ නිසා අතිරික්ත අය -වැයක් වාර්තා කර ඇත. එහෙත් වසර කීපයකට පසු දේශීය ආදායමට වඩා දේශීය වියදම ඉහළ යමින් ක්‍රමයෙන් වසරින් වසර පුලුල් වන අය-වැය හිඟයක් මෙම දක්වා වර්ධනය වී ඇත. නිදහසින් පසු වසර 1977 අගභාගය වන තෙක් විවිධ ආණ්ඩු යටතේ විවිධ ආර්ථික ක්‍රමෝපායන් රටේ වර්ධනය හා සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කොට ඇත.

වර්ෂ 1978 සිට 2005 දක්වා කාලය තුළ එතෙක් පැවති විවිධ වූ ආර්ථික බාධාකාරී තත්ත්වයන් පෞද්ගලික අංශය වෙත විශේෂයෙන්ම විදේශ ආයෝජකයන් වෙනුවෙන් ලිහිල් කිරීම සිදුකරන ලදි. ඒ සඳහා රටේ එතෙක් පැවති නීතිරීති පවා සංශෝධනය කිරීමට සිදුවිය. සෘජුවම විදේශ වෙළෙඳපොළ හා සම්බන්ධ වීමෙන් ලබා ගත හැකි යැයි අපේක්ෂා කරන ලද සාපේක්ෂ පිරිවැය වාසි හා දේශීය නිෂ්පාදන ධාරිතාව ඉක්ම වූ පරිභෝජන මට්ටමකට යා හැකි යැයි යන සිද්ධාන්තයේ සිට කටයුතු කිරීම මෙහි දී හැකි පෙනෙන්නකි.